වගා සහනාධාර චක්‍රලේඛ අංක - 81

අපේ අංකය:-සං/01

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

අංක 70, පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

2020.07.08

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,

**<u>පාංශු තත්ව දර්ශකය (SQI) භාවිතා කොට පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීම.</u>**

තේ නැවත වගාවට පෙර පස පුනරුත්ථාපනය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් විද්‍යාත්මක පදනමකින් කටයුතු කිරීම පිණිස තේ පර්යේෂණායතනය විසින් 2018 දෙසැම්බර් මස නැවතවගා කිරීමට පෙර පස පුනරුත්ථාපනය කිරීම පිළිබඳව තීරණ ගැනීම සඳහා "පාංශු තත්වය දර්ශකය" භාවිතයට මාර්ගෝපදේශ අංක 01/2018 නිකුත් කර ඇත. එමගින් තේ ඉඩම්වල පාංශු තත්වය පරීක්ෂාවට ලක්කර විවිධ කලාප අනුව හඳුන්වාදී ඇති පාංශු තත්ව දර්ශක අගයට සමාන හෝ වැඩි අගයක පවතින තේ ඉඩම්වල අනෙකුත් නිර්දේශිත කෘෂිකාර්මික ක්‍රියාවිධි පිළිවෙත් අනුගමනය කරමින් පස පුනරුත්ථාපනය කිරීමෙන් තොරව තේපැල සිටුවීමට නිර්දේශ ලබාදී ඇත.

2020.02.13 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීමේදී තේ පර්යේෂණායතනය මගින් හඳුන්වාදී ඇති මෙම ක්‍රමවේදය පාදකව කටයුතු කිරීම අනුමත කර ඇත.ඒ අනුව ඉදිරියට පාංශු තත්වය දර්ශකය (SQI) පාදකව පමණක් පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කල යුතුය.

2018.07.26 දිනැතිව නිකුත් කර ඇති වගා සහනාධාර චක්‍රලේඛ අංක 76 අනුව තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් මූලික පරීක්ෂණ වාර්තාව සමග ලබාගන්නා RP/NP - 4A ආකෘතිය මගින් පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳ ලබාදෙන නිර්දේශ පාදකව තේ නැවත වගාව යටතේ RP/A අවසර පත්‍ර නිකුත් කිරීම මින් ඉදිරියට අත්හිටවනු ලැබේ.

පස පුනරුත්ථාපනයෙන් තොරව පාංශු තත්ව දර්ශකය (SQI) පාදකව තේ නැවත වගා කිරීම.

i. මෙම අවසර පත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත්කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපි. 370,000/= ක් වනසේ ගෙවීම කලයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1.බිම් සැකසීම<br>2.තේ වගාකිරීම<br>3.වසරක නඩත්තුව | 130,000/=<br>190,000/=<br>50,000/= |
| එකතුව | 370,000/= |

ii. තේ පර්යේෂණායතනයේ මාර්ගෝපදේශයට අනුව විවිධ තේ වගා කලාප සඳහා නිර්දේශිත පාංශු තත්ව දර්ශක (SQI) අගයට නොඅඩු අගයක් පෙන්නුම් කරන ඉඩම් සඳහා පමණක් පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කලයුතුය. මෙම අවසර පත්‍ර ලබාදීමේදී සහනාධාර පරිගණක වැඩසටහනේ SQI යටතේ ඇති කේත භාවිතයට ගතයුතුය.

iii. මේ යටතේ නිකුත් කරන අවසර පත්‍රවල වල අනෙකුත් නිර්දේශිත කෘෂිකාර්මික පිලිවෙත් අනුගමනය කරමින් තේ පැල සිටුවීම සම්පූර්ණ කලයුතුය.

iv. තේ නැවත වගාව සඳහා එක් ඉඩම් හිමියෙකුට වර්ෂයකට සහනාධාර ලබාදෙන උපරිම බිම් සීමාව වන හෙක්ටයාර් 2ක් දක්වාම මේ යටතේ අවසර පත්‍ර නිකුත් කල හැකිය.

මෙම නව ක්‍රමවේදයට අදාලව වැඩිදුරටත් පැහැදිලි කරගැනීමට අවශ්‍ය වන්නේ නම් නියෝජ්‍ය සාමානාධිකාරී(සංවර්ධන) ඇමතීමට කටයුතු කරන මෙන්ද දන්වමි.

මහින්ද විදානපතිරණ

සභාපති

<u>පිටපත්:-</u>

01.සාමාන්‍යාධිකාරී
02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන/ව්‍යාප්ති)
03.අභ්‍යන්තර විගණක
04.කළමනාකරු සැලසුම්/නියමුකරණ
05.සියලුම මාණ්ඩලික නිලධාරීන්
06.සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
07.සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
08.ගරු ලේකම්/ගරු සභාපති සමස්ත ලංකා සමිති සංවිධානය